中国国际广播电台
CHINA RADIO INTERNATIONAL

# ශුභාශීර්

# 蓮花

2018 - තෙවන කලාපය



中国国际广播电台和斯里兰卡红十字协会联合出版




# චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය

චීනය සහ ජාත්‍යන්තර ප්‍රජාව එකට එක් කරමින් චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය ආරම්භ කෙරුණේ 1941 දෙසැම්බර් මස 3 වැනි දාය. අද වන විට එය ලොව පුරා වැඩිම භාෂා ගණනාවක් විකාශනය කරන විශාලතම ගුවන් විදුලි ජාලයක් බවට පත්ව තිබේ. එයින් ලොව පුරා විකාශනය කෙරෙන භාෂා ගණන මේ වන විට 65කි. ලෝකයේ සංනිවේදන විධික්‍රම වඩාත් පුළුල් වීමත් සමඟ අන්තර්ජාල රූප මාධ්‍ය හා ජංගම දුරකථන සහ පොඩ්කාස්ටින් වැනි නූතන බහුවිධ මාධ්‍ය ඔස්සේ සිය විකාශන ජාලය ශක්තිමත් කිරීමට චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය පියවර ගත්තේය.

ඒ අනුව වසර 2011 ජනවාරි 18 වනදා CIBN චීන අන්තර්ජාතික ගුවන්විදුලි විකාශන ජාලය ආරම්භ කෙරිණ. ලොවපුරා ප්‍රවෘත්ති ඒජන්සි මධ්‍යස්ථාන 8ක් පවතින අතර රටවල් 32ක ප්‍රවෘත්ති වාර්තාකරණ ඒජන්සි ආයතන පිහිටුවා තිබේ. ලොව පුරා විසිරුණු කොන්ෆියුසියස් මධ්‍යස්ථාන සංඛ්‍යාව 13කි. චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ අසන්නන්ගේ සමාජ 4114ක් ලොව පුරා ක්‍රියාත්මකය.

# සුභාසර 蓮花


**චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය**

**SINHALA SERVICE**

**CHINA RADIO INTERNATIONAL**

No.16A, Shijingshan Road,
Beijing, P.R. China
Post code:100040

00 86 10 6889 2374/0439

00 86 10 68892361

sinhalacri@gmail.com

http://sinhalese.cri.cn/

Cheena Sinhala handa

Voice of China-Lanka



**අනුශාසකත්වය**

ජගත් අබේසිංහ

සුදත් මඩුගල්ල

**සංස්කාරක**

ශී යුයැ, හාඕ ලී ෆාං, සුන් ජ්යා ජ්යා

**කතෘ මඩුල්ල**

ශී යුයැ, ෂෞං ලී, ලියු හුයි,
හාඕ ලී ෆාං, චාං යෝ යෝ, සුන් ජ්යා ජ්යා,
චෙන් ගුවැන් වන්, සුන් ජියෑන් චාඕ,
රවිමල් හඳුවල, සුගත් රත්නායක,
නිසංසලා රත්නායක

**ප්‍රකාශනය**

චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය සහ
ශ්‍රී ලංකා රතු කුරුස සමාජය


## පටුන


චීන අප්‍රිකා සබඳතාව පිළිබඳ අලුත් තලයක් 2

බෙයිජිං නගරයේ සුන්දර ගම්මාන දාහක් 8

සුවෙයි ච්‍යාං කෝරළය නැවත
ස්ථාන ගත කිරීමේ කතාන්දරය 11

වසර 15 ක ඉතිහාසයක් සහිත ශංහැයි පොත්
ප්‍රදර්ශනය 14

අප්‍රිකානු පාරිභෝගිකයන්ගේ හදවත් දිනාගත්
චීන ජංගම දුරකථන නිෂ්පාදිත 17

ජේ චෝ 20

මා ආත්මීයව ප්‍රියකරන චීනය 23

චීන මහා ප්‍රාකාරයේ රාත්‍රියක් 26

පිබිදුණු පෞඩත්වය-චීනයේ අසිරියෙන් බිඳක්
සෘතු හතරකට මැදි වූ බෙයිජිං අසිරිය 29

සිචුවාන් හි අලුතින් පිබිදුණු 'ෂිංග්ෆු' ගම්මානය 32

අසන්නන්ගේ බිත්ති පුවරුව 35

එදිනෙදා චීන බස 36

ශ්‍රී ලංකා රතු කුරුස සමාජයෙන් 38

# චීන අප්‍රිකා සබඳතාව
## පිළිබඳ අලුත් තලයක්

චීන අප්‍රිකා සහයෝගිතා සාකච්ඡා සභාවේ 2018 බෙයිජිං සමුළුව චීනයේ බෙයිජිං නගරයේදී පැවැත්විණ. අප්‍රිකා රටවල් 53ක නායකයෝ සහ නියෝජිතවරු, එක්සත් ජාතීන්ගේ මහලේකම් ඇන්තෝනියෝ ගුටරෙස් මහතා, අප්‍රිකා සන්ධාන කොමිසමේ සභාපතිවරයා සහ ජාත්‍යන්තර හා කලාපීය සංවිධාන 27ක නිරීක්ෂකයෝ එම සමුළුවට එක් වූහ. "සහයෝගිතා හා පොදු ජයග්‍රහණ මත අත්වැල් බැඳ ගෙන වඩා සමීප චීන-අප්‍රිකා පොදු ඉරණමක් සහිත ඒකකය ගොඩනැගීම" යන ප්‍රධාන තේමාව යටතේ ඉදිරි වසර තුන තුළ හා ඉන් පසු කාලය තුළ ප්‍රධාන මෙහෙයුම් අටක් ක්‍රියාත්මක කිරීමට චීනය හා අප්‍රිකාව අවධානය යොමු කරයි. කර්මාන්ත සංවර්ධනය, පහසුකම් අන්තර්ගතය, වෙළඳ ගනුදෙනු පහසුකරණය, හරිත සංවර්ධනය, හැකියාව ගොඩනැගීම, සෞඛ්‍ය සේවය, සංස්කෘතික හුවමාරු, සාමය හා ආරක්ෂාව ඇතුළු ක්ෂේත්‍ර වල පවතින සහයෝගිතා පුළුල් කිරීමට මෙමඟින් අපේක්ෂා කෙරේ. ඒ සඳහා චීනය අප්‍රිකාව වෙනුවෙන් ඇ. ඩො. බිලියන 60ක සහනාධාර ලබා දීමට නියමිතව ඇතැයි චීන ජනාධිපති ෂී ජින් පිං මහතා ප්‍රකාශ කළේය.

චීන අප්‍රිකා සහයෝගිතා සාකච්ඡා සභාවේ සාමාජික රටවල නායකයන් බෙයිජිංහි රැස්ව වඩා සමීප චීන අප්‍රිකා පොදු ඉරණමක් සහිත මානව ප්‍රජාව ගොඩනැගීම පිළිබඳ බෙයිජිං ප්‍රකාශනය හා චීන අප්‍රිකා සාකච්ඡා සභාවේ බෙයිජිං ක්‍රියාකාරී සැලැස්ම සම්මත කර තිබේ. ඉන් චීනය හා අප්‍රිකාව අත්වැල් බැඳ ගෙන ඉදිරියට යාමේ පණිවිඩය ලෝකයට ඉදිරිපත් කෙරෙන බව ෂී ජින් පිං මහතා කියා සිටියේය. එය චීනය, අප්‍රිකාව හා ජාත්‍යන්තර ප්‍රජාව පුරා උණුසුම් සාකච්ඡාවට ලක් ව තිබේ. චීනය අප්‍රිකාවට විශ්වාසය තැබිය හැකි හවුල්කරුවා මෙන්ම මිතුරා බව එම සමුළුවට එක් වූ අප්‍රිකාවේ විවිධ රටවල රාජ්‍ය නායකයෝ ප්‍රකාශ කළහ.

චීනය සහ අප්‍රිකාව විශේෂ ලක්ෂණ සහිත සහයෝගිතා මගින් පොදු ජයග්‍රහණ ඉටු කිරීමේ මාර්ගයක් කරා ඉදිරියට යමින් සිටින බව චීන ජනාධිපති ෂී ජින් පිං මහතා ප්‍රකාශ කළේය. අප්‍රිකාව සමඟ සහයෝගිතා පැවැත්වීමේදී අප්‍රිකා රටවල් සිය රාජ්‍ය තත්වයට ගැලපෙන වර්ධන මාර්ග ගවේෂණයට සහය දෙන බවත් එම රටවල අභ්‍යන්තර කටයුතුවලටත් මැදිහත් නොවී සිය මතයන් එම රටවලට පැටවීමට බල නොකරන බවත් ෂී ජින් පිං මහතා සඳහන් කළේය. එමෙන් ම චීනය අප්‍රිකාවට දේශපාලන කොන්දේසි රහිත සහනාධාර ලබා දෙන අතර දේශපාලන පලප්‍රයෝජනය රහිතව අප්‍රිකාවේ මුදල් ආයෝජනය සහ අරමුදල් රැස් කරන බව ද හෙතෙම පැවසීය.

චීනය එම සමුළුවේදී ඉදිරි අදියරේ චීන-අප්‍රිකා ප්‍රායෝගික සහයෝගිතා සඳහා මෙහෙයුම් 8ක් ඉදිරිපත් කළේය. එම මෙහෙයුම් අනිවාර්යයෙන්ම අප්‍රිකා නව වර්ධනයට දායක වෙයි. එය අප්‍රිකාවේ අවශ්‍යතාවන්ට අනුව සංවර්ධන ඉලක්ක ඉටු කිරීමට උපකාරී වෙයි. එය අප්‍රිකා ජනතාව සිය සංවර්ධනය කෙරෙහි විශ්වාසය තැබීමටද ඉවහල් වනු ඇත. එමෙන්ම එමගින් සමස්ත ලෝකය අප්‍රිකාව කෙරෙහි



ඉදිරිපත් කිරීම : ශී යුයැ






















අවබෝධතා ශක්තිමත් කොට ජාත්‍යන්තර ප්‍රජාව අප්‍රිකාවේ ආයෝජන හා සහයෝගතා වැඩි කරනු ඇත.

එම සමුළුවෙන් පසුව චීන ජනාධිපති ෂී ජින් පිං මහතා, සාකච්ඡා සභාව් හිටපු සම සභාපති දකුණු අප්‍රිකා ජනාධිපතිවරයා හා නව සම සභාපති සෙනෙගල් ජනාධිපතිවරයා සමඟ බෙයිජිං මහජන මහ ශාලාවේ පැවති මාධ්‍ය හමුවකට එක් වූහ.

මෙවර බෙයිජි සමුළුව මගින් චීන අප්‍රිකා සබඳතාව නව ඓතිහාසික පරිච්ඡේදයකට පිවිසීම හා සංවර්ධන වෙමින් පවතින රටවල් අතර සහයෝගතාවන්හී නව යුගයේ සන්ධිස්ථානයක් සනිටුහන් කරන බව ෂී ජින් පිං මහතා පැවසීය.

ගෙවී ගිය වසර 18තුළ, ඇතැම් බටහිර රටවල් චීන අප්‍රිකා සහයෝගතාව කෙරෙහි සැක කරමින් අපකීර්තිය පළ කළේය. එහෙත් චීනය හා අප්‍රිකාව ශක්තිමත් ලෙස ඉදිරියට ගමන් කරමින් ප්‍රායෝගික ප්‍රතිඵල අත්කර ගෙන තිබේ.

ඊනියා ණය උගුල යන්න ප්‍රකාශය බටහිර මාධ්‍ය චීනය අප්‍රිකාවේ සිදු කළ ආයෝජන කෙරෙහි නිර්මාණය කරන ලද්දකි. එහෙත් අලුත් වාර්තාවකට අනුව, චීන ණය අප්‍රිකාවේ ණය ප්‍රශ්නයෙහි ප්‍රධාන සාධකයක් නොවේ. අප්‍රිකා රටවල් වල ණය ප්‍රශ්නය ඇති වූයේ බොහෝ ජාත්‍යන්තර මූල්‍ය ආයතන හේතුවෙනි.

අද වන විට, චීන අප්‍රිකා සහයෝගතාව හරහා විශේෂ ලක්ෂණයන්ගෙන් යුත් පොදු ජයග්‍රහණ හිමි ක්‍රියාදාමයක් බිහි කර තිබේ. චීනයේ සහ අප්‍රිකාවේ ජනගහණය මුළු ලෝක ජනගහණයෙන් තුනෙන් එකක් ගනී. චීනය හා අප්‍රිකාව සාමකාමී සංවර්ධන සහ පොදු සමෘද්ධිය ඉටු කර ජනතාවගේ සුභ සෙත ඉහළ නංවාලීමෙන් ගොලීය තිරසර සංවර්ධන ඉලක්කය සැබෑ කළ හැකිය.

චීන අප්‍රිකා සහයෝගතාව අලුත් තලයකට ප්‍රවේශ වී තිබේ. ඒ පිළිබඳ විශේෂ ලක්ෂ තුනක් පවතී. චීන අප්‍රිකා ජනතාවගේ පලප්‍රයෝජනයන් මූලික කර ගැනීම, අප්‍රිකාවේ ස්වයං සංවර්ධන හැකියාව ශක්තිමත් කිරීම සහ ක්‍රමෝපායීය සම්බන්ධවීම තහවුරු කිරීම ඒ විශේෂ ලක්ෂයන් වෙයි. සාමය සහ සංවර්ධනය යන්න වාර්තමාන යුගයේ ප්‍රධාන තේමාවට මුහුණ දීමේදී “ සහයෝගතා හා පොදු ජයග්‍රහණ මත අත්වැල් බැඳ ගෙන වඩා සමීප චීන-අප්‍රිකා පොදු ඉරණමක් සහිත ඒකකය ගොඩනැගීම” යන ක්‍රමය, දෙපාර්ශවයන්ගේ පොදු තේරීම බවට සැකයක් නොමැත.







# බෙයිජිං නගරයේ සුන්දර ගම්මාන දාහක්

2018 වසරේ බෙයිජිං නගරයේ සුන්දර ගම්මාන 1000ක් ගොඩනැගීමට බලාපොරොත්තු වේ.

ගෙවී ගිය වසර පහ තුළ බෙයිජිං ප්‍රදේශයේ සුන්දර ගම්මාන 1300ක් සංවර්ධනය කර තිබේ. එමෙන්ම විනෝදාංශ කෘෂිකර්මාන්තය හා ග්‍රාමීය සංචාරක කර්මාන්තය සමෘද්ධිමත් ව වර්ධනය වෙමින් එහි ජෛව පරිසරය කැපී පෙනෙන ලෙස යහපත් වී තිබේ.

ග්‍රාමීය පුනර්ජීවන උපායමාර්ගය ක්‍රියාත්මක කිරීම චීන කොමියුනිස්ට් පක්ෂයේ 19වැනි ජාතික නියෝජිත සම්මේලනයේ ඉදිරිපත් කළ වැදගත් තීරණයක් මෙන්ම නූතන සමාජවාදී රටක් සම්පූර්ණයෙන් සංවර්ධනය කිරීමේ වැදගත් ඓතිහාසික කාර්යයකි.

සුන්දර ගම්මාන සංවර්ධනය කිරීම ග්‍රාමීය පුනර්ජීවන උපායමාර්ගය ක්‍රියාත්මක කිරීමේ වැදගත් පියවරකි. ගෙවී ගිය වසර පහ තුළ බෙයිජිං ප්‍රදේශයේ ගම්මාන 2513ක පවුල් ලක්ෂ 9.5ක් පමණ ගල් අඟුරු භාවිතය වෙනුවට ස්වභාවික පවිත්‍ර ගෑස් භාවිතය සඳහා යොමු කිරීමට සමත්ව තිබේ. එවගේම විනෝදාංශ කෘෂිකර්මාන්තය හා ග්‍රාමීය සංචාරක කර්මාන්තය සමෘද්ධිමත් ලෙස වර්ධනය වී තිබේ. පසුගිය වසරේ එහි වැසියන් එයින් ලබා ගත් ආදායම යුවාන් කෝටි 441ක් පමණ ය. එමෙන්ම බෙයිජිං නගරයේ සමතලා බිම් වනාන්තර භූමි ආවරණ ප්‍රමාණය 43%කින් වැඩි විය. ගඟා ප්‍රධානී ක්‍රමය ස්ථාපිත කොට ක්‍රියාත්මක කිරීමෙන් එහි අපජලය පාලනය කිරීමේ අනුපාතය 92%ක ඉක්මවා ගොස් තිබේ.

2018 වසරේ බෙයිජිං ප්‍රදේශයේ සුන්දර ගම්මාන 1107ක් ස්ථාපිත කිරීමට නියමිත ය. දූෂණ පාලනය හා හරිතකරණ සංවර්ධනය එහි ප්‍රධාන කාර්යයන්.

ග්‍රාමීය ප්‍රදේශවල වැසියන්ගේ ජන ජීවිතය යහපත් කොට වෛද්‍ය සේවා ආවරණය හා හැකියාව ඉහළ නංවා ගැනීම සම්පූර්ණයෙන් ඉටු කිරීමට අපේක්ෂා කෙරේ.





ඉදිරිපත් කිරීම : හාඕ ලී ෆාං







# සුවෙයි ච්‍යාං කෝරළය නැවත ස්ථාන ගත කිරීමේ කතාන්දරය

චෞටොං නගරය ඊසාන චීනයේ යුන් නැන් පළාතේ පිහිටා තිබේ. යැංසි ගඟේ පළමු වරාය වන ශුවෙයි ෆු වරාය මෙහි පිහිටා තිබෙන නිසා එම නගරය යැංසි ගඟේ ඉහත කොටසේ වැදගත් ජෛව ආරක්ෂක කඳවුරකි. එමෙන් ම සමස්ත යුන් නැන් පළාත යැංසි ගඟ ආර්ථික තීරයේ වර්ධන උපාය මාර්ගයට එක් කරන වැදගත් පාලමක් ලෙසට ද චෞ ටොං නගරය සැලකෙයි.

පින් ශා ගඟේ පහළ කොටසේ පිහිටි ජල විදුලි බලා-ගාර 3ක් ඉදි කිරීම සඳහා චෞ ටොං නගරයේ වැසියන් එක් ලක්ෂ 60 දහසක් ඉවත් කළ යුතු විය. ඒ අතරින් සියාන් චියා බා ජල විදුලි බලාගාරය වසර 2012හේ ඔක්තෝබර් මාසයේ සහ සි ලුවෝ ඩු ජල විදුලි බලාගා-රය වසර 2013නේ මැයි මාසයේ විදුලිය නිපදවීම සඳහා එහි වැසියන් 111 දහස් 8 සීයක් නැවත ස්ථාන ගත කිරීමේ ව්‍යාපෘතිය නියමිත වේලාවට අවසන් වී තිබේ. මෙම ව්‍යාපෘතිය චීන රජය ක්‍රියාත්මක කරන බටහිර විදුලිය නැගෙනහිරට ප්‍රවාහන කිරීමේ උපාය මාර්ගය සඳහා වන වැදගත් මෙහෙවරකි.

සුවෙයි ච්‍යාං කෝරළය එම සුවිශාල ජල විදුලි බලාගා-ර 2 අතර පිහිටා තිබේ. සියාන් චියා බා ජල විදුලි බලාගාරය ඉදි කිරීම සඳහා සමස්ත කෝරළය සහ ගම්මාන 3ක් ඉවත් කළ යුතු විය. එබැවින් සුවෙයි ච්‍යාං වැසියන් වසරක් පමණ තුළ සමස්ත ලෙස නැවත ස්ථාන ගත කොට කෝරළයක් ඉදි කර තිබේ. මාස 2ක් තුළ වැසියන් 60 දහසක් ස්ථාවර ලෙස ස්ථාන ගත කර තිබේ. මාසයක් තුළ වසර 100ක පමණ ඉතිහාසයක් සහිත පැරණි කෝරළය ස්ථානගත කිරීමේ කාර්ය ඉටු කර තිබේ. මෙම ජයග්‍රහණ 3 චීනයේ ජල විදුලි සංග්‍රාමික ඉතිහාසයේ මහා පුදුම 3ක් යන නමින් නම් කරනු ලැබේ.

එමෙන් ම චෞ ටොං නගර රජය දිළිඳු හා දුරස්ථ කඳුකර වැසියන්ගේ ජීවිත තත්වය යහපත් කිරීම සඳහා ඔවුන් නාගරික ප්‍රදේශවල ස්ථාන ගත කර තිබේ. දිළිඳු පරිසරය වෙනස් කරමින් නව ජීවිතය ඔවුන්ට අත්පත් කර දීම ද සාර්ථක වී ඇත.

ඉදිරිපත් කිරීම : චාං යෝ යෝ





# වසර 15 ක ඉතිහාසයක් සහිත

# ශංහැයි පොත් ප්‍රදර්ශනය

ශ්‍රී ලංකාවේ සාහිත්‍ය මාසය සැප්තැම්බර් මාසයේ යෙදී තිබේ. එම මාසයේ පොත් කියවීම මෙන්ම කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයට පැමිණ පොත් ලබා ගැනීම විශේෂයෙන්ම ජනප්‍රියයි. චීනයේ ජාතික වශයෙන් සාහිත්‍ය මාසයක් නොමැත. එහෙත් විවිධ නගරවලදී පොත් ප්‍රදර්ශන නිතරම පැවැත්වේ.

සෑම වසරක ම අගෝස්තු මාසයේ චීනයේ ශංහැයි නගරයේදී ශංහැයි පොත් ප්‍රදර්ශනය පැවැත්වේ. මෙවර එහදී 150000 පමණ විවිධ වර්ගයේ පොත් ප්‍රදර්ශනය කෙරිණ. එමෙන්ම දෙස් විදෙස් ප්‍රකාශකයින් 500 දෙනෙකු පමණ ඊට සහභාගී වූහ.

2003 වසරේ ආරම්භ වූ මෙම වාර්ෂික පොත් ප්‍රදර්ශනය ගතවූ වසර 15ක කාලය තුළ සුවිශේෂ කාර්යභාරයක් ඉටු කර ඇත. වර්තමානයේ ජංගම දුරකථන සහ අන්තර්ජාලය ඇතුළු විවිධ විද්‍යුත් උපකරණ භාවිත කිරීමේ තත්ත්වය යටතේ පොත් කියවීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම ඉතා වැදගත් වේ. ශන්හැයි පොත් ප්‍රදර්ශනය එවැනි කටයුතුවලට විශාල ලෙස දායක විය.

සෑම වසරක ම පොත් ප්‍රදර්ශනය පැවැත්වීමේ කාලයේ ජාත්‍යන්තර සාහිත්‍ය සතිය නමින් ක්‍රියාකාරකම් රැසක් පැවැත්වේ. මේ වසරේ ලෝකයේ ප්‍රවීණ ලේඛකයන් 30 දෙනෙක් ඊට සහභාගි වූහ. එපමණක් නොව පොත් කියවීම හා සම්බන්ධ ක්‍රියාකරකම් 1150ක් පමණ පැවැත් වූහ.ඒ නිසා එම ප්‍රදර්ශනයට බොහෝ ශංහැයි වැසියන් ආකර්ෂණය වූහ. ශංහැයි පොත් ප්‍රදර්ශනයට තවත් වැදගත් කාර්යයක් තිබේ. එමගින් ප්‍රකාශන කර්මාන්ත සංවර්ධන කිරීම සහ ජාත්‍යන්තර අදහස් හුවමාරු කිරීම ඒ අතර ප්‍රධානයි.

ශංහැයි නගරය සහ ප්‍රකාශන කටයුතු අතර ගැඹුරු සබඳතාවක් තිබේ. නූතන චීනයේ ප්‍රකාශන කටයුතු ආරම්භ වන්නේ ශංහැයි නගරයේදීය. විශේෂයෙන්ම විදේශ සාහිත්‍ය නිර්මාණ චීන භාෂාවට පරිවර්ථනය කිරීමේ කටයුතු ශංහැයි නගරයේදී සිදු විය. ඒ කාලයේ බොහෝ චීන ප්‍රවීණ ලේඛකයන් එම කටයුතුවලට සහභාගි වීම ඉතා වැදගත් බව සඳහන් කළ යුතුය. එම කාලයේ සිට මේ දක්වා චීනයේ විදේශ සාහිත්‍ය පරිවර්තන කටයුතු ප්‍රකාශන කිරීමේ කටයුතුවල කේන්ද්‍රස්ථානයක් ලෙෂ ශංහැයි නගරය සැලකේ. ඒ නිසා මෑත වසර කිහිපය තුළ ශංහැයි පොත් ප්‍රදර්ශනය චීනය හා ලෝකයේ ප්‍රකාශන කර්මාන්තයේ අදහස් හුවමාරු කර ගැනීමේ ඉතා වැදගත් වේදිකාවක් බවට පත් වී තිබේ.



ඉදිරිපත් කිරීම : සුන් ජියා ජියා













# අප්‍රිකානු පාරිභෝගිකයන්ගේ හදවත් දිනාගත් චීන ජංගම දුරකථන නිෂ්පාදිත



නවීණකරණ රටක් ගොඩ නැගීම චීනයේ අභිලාෂයකි. විද්‍යා තාක්ෂණ හා නවීණකරණය පදනම් වන ව්‍යවසායන් දිරිගන්වමින් තව තවත් ඉහළ තලයට ගෙන යාම, ඒ සඳහා චීන රජය ගෙන ඇති පියවරකි. Made-in-China යන ලේබලයෙන් විවිධ චීන නිෂ්පාදිත අද කාලයේ ලොව පුරා ගලාගෙන ඇත්තේ අඩු මිළ පමණක් නොව නිර්මාණශීලිත්වය හා නවීණත්වය යන ගුණාංග සහිතව ය. ලොව පුරා ප්‍රචලිත වී ඇති Huawei හා Xiaomi වැනි ප්‍රබල ටෙලිකොම් සමාගම් හැරෙන්නට, අප්‍රිකානු කලාපයේ ටෙලිකොම් වෙළෙඳ පොලේ කැපී පෙනෙන චීන ජංගම දුරකථන නිෂ්පාදන සමාගමක් වන Transsion සමාගම ඒ සඳහා වන කදිම උදාහරණයකි.

දකුණු චීනයේ ගුවං තුං පළාතේ ශෙන් චෙන් නගරයේ සිය මූලස්ථානය පිහිටි Transsion සමාගම මීට වසර 10 කට කලින් අප්‍රිකානු කලාපයට පිවිස මේ වන විට එහි ටෙලිකොම්






වෙළෙඳ පොලේ 38%ක පමණ ප්‍රතිශතයක් අත්කර ගැනීමට සමත් වී තිබේ. අප්‍රිකානු වෙළෙඳ පොල පිළිබඳ පූර්ණ අවබෝධයක් තිබීම සහ ප්‍රබල තාක්ෂණිකයන් සිටීම එම සාර්ථකත්වයට හේතු වී තිබෙන බව Transsion සමාගම පවසයි. අප්‍රිකානු ජාතිකයන්ට ම සරිලන ජංගම දුරකථන නිෂ්පාදනයට එම සමාගම අවධානය යොමු කර තිබේ.

ටෙලිකොම් ජාල යටිතල පහසුකම් අවම මට්ටමේ පවතින නිසා ජංගම දුරකථන කිහිපයක් හෝ සිම් කාඩ් කිහිපයක් භාවිත කිරීම බහුතර අප්‍රිකානු ජාතිකයන්ගේ තේරීම ය. බොහෝ ජංගම දුරකථන මෙහෙයුම් සමාගම් තිබෙන තත්වය යටතේ විවිධ ටෙලිකොම්











ජාල අතර මාරු කරමින් ජංගම දුරකථන භාවිත කිරීමට ඔවුන්ට සිදු වේ. අප්‍රිකාවේ විදුලි සැපයුම පවතින්නේ ද දුර්වල තත්වයේ ය. නිරන්තරයෙන් සිදු වන විදුලි කැපීම ජංගම දුරකථන බැටරි ආරෝපණය කිරීමට බාධාවක් වේ. අප්‍රිකාවේ පවතින මෙවන් විශේෂ තත්වයන් සලකා බලා Transsion සමාගම ඊට අනුකූලව TECNO , INFINIX සහ ITEL ඇතුළු වෙළෙඳ ලකුණු සහිත ජංගම දුරකථන නිෂ්පාදනය කර තිබේ. ඒ, සිම් කාඩ් 3ක් 4ක් දැමිය හැකි, එක් වතාවක් ආරෝපණය කිරීමෙන් මාසයකට ආසන්න කාලයක් බැටරි නොබසින, සෙල්ෆි ඡායාරූප ගැනීම වඩාත් පහසු කිරීමට ඉදිරිපස කැමරාව සහිත ජංගම දුරකථන. ඒ විතරක් නෙමෙයි, අලෙවියෙන් පසු සේවා පිළිබඳව ද Transsion සමාගම සැලකිල්ල දක්වයි. මේ වන විට Transsion සමාගම අප්‍රිකානු රටවල විවිධ නගරවල හා උපනගරවල අලෙවියෙන් පසු සේවා මධ්‍යස්ථාන 1000කට වැඩි සංඛ්‍යාවක් ස්ථාපිත කර තිබේ. එබැවින් ඉතා අඩු මිළට මිළදී ගත හැකි එම ජංගම දුරකථන අප්‍රිකානු ජාතිකයන්ගේ විශේෂ ඇල්මට ලක් ව තිබෙන්නේ වැඩි කාලයක් ගත වීමට පෙර ය.

අප්‍රිකානු පාරිභෝගිකයන්ගේ හදවත් දිනාගැනීම Transsion සමාගම විදේශයන්හි සිය ව්‍යාපාර ව්‍යාප්ත කිරීමට ලද ජයග්‍රහණයකි. අප්‍රිකාවේ ටෙලිකොම් වෙළෙඳ පොලේ නැගෙමින් පවතින මිළදී ගැනීමේ ශක්තිය වර්ධනය කරමින් එම වෙළෙඳ පොලට සරිලන ස්මාර්ට් ජංගම දුරකථන නිෂ්පාදනය කිරීම, Transsion සමාගමේ ඉදිරි අරමුණ ය.

ඉදිරිපත් කිරීම : ෂෞං ලී







# ජේ චෝ



ඉදිරිපත් කිරීම : වෙන් ගුවැන් වන්

ජේ චෝ 1979 වසරේ චීනයේ තායිවාන පළාතේ ෂින් බෙයි නගරයේ උපත ලැබීය. මේ වන විට ඔහුට පටබැඳි හැඳින්වීම් රැසක් තිබේ. නායකයා, නළුවා, අධ්‍යක්ෂවරයා, තිර රචකයා හා ව්‍යාපාරිකයා යනාදී නාමවලින් ඔහු හැඳින්වේ. එහෙත් මේ හැඳින්වීම් අතරින් ප්‍රකට ම එක වන්නේ නායකයා යන්නය.

ජේ චෝ 2000 වසරේ සිය ප්‍රම සංගීත ඇල්බමය නිකුත් කළේය. ඔහුගේ විශිෂ්ට සංගීත වෘත්තිය ආරම්භ කෙරුණේ මේ ඇල්බමයේ නමද ඔහුගේ සැබෑ නම වීම විශේෂත්වයකි. මේ ඇල්බමය නිකුත් කිරීමෙන් පසු ඔහුටම ආවේණික වූ සංගීත ශෛලිය චීන සංගීත ක්ෂේත්‍රයේ දැඩි අවධානය ආකර්ෂණය කර ගැනීමට සමත් විය. 2001 වසරේ ෆැන්ටසි නම් ඔහුගේ දෙවන ඇල්බමය මගින් ඔහු චීන සංගීත හා බටහිර රටවල සංගීත විශේෂයන් මිශ්‍ර කර නිර්මාණය කරන සංගීත ශෛලිය නිල වශයෙන් තහවුරු විය.

සෑම වසරකම ඔහු ඇල්බමක් නිකුත් කරයි. ඔහුගේ ගීත පාසල් සිසු සිසුවියන් වැඩියෙන් ම කතා කරන ගීතයයි. එම සිසු සිසුවියන් වැඩිහිටියන් බවට පත් වීමෙන් පසු බොහෝ දෙනා සිතා ගෙන සිටින්නේ ජේ චෝ ගේ ගීත ඔවුන්ගේ තරුණ්‍යය සංකේතවත් කළ හැකි බවයි. මේ ගීතවල තේමා වැඩියෙන් තරුණ්‍යය, ආදරය හා පාසල් ජීවිතය හා සම්බන්ධ ය. ඒ හේතුවෙන් එය තරුණයන්ගේ ආකර්ෂණයට ලක්වෙයි.

චීනයේ පමණක් නොවේ ආසියාවේ හා ලෝකයේ අවධානය ඔහු වෙත හිමිව තිබේ. 2003 වසරේ ඇමෙරිකාවේ ටයිම් සඟරාවේ මුල් කවර පුද්ගලයා ලෙසටද ඔහු පත් විය. 2004 වසරේ ලෝක සංගීත සම්මානයේ චීන ශාඛාවේ වැඩි ම නිර්මාණ අලෙවි වාර්තා තැබූ කලාකරුවාගේ සම්මානය ජේ චෝ දිනා ගත්තේය. සංගීත නිර්මාණය කිරීම හැර ඔහු සිනමා ක්ෂේත්‍රයටද එක් විය. ඉනීෂියල් ඩී නම් චිත්‍රපටයේ ඔහු ප්‍රධාන නළුවා විය. 2005 වසරේ මේ චිත්‍රපටයත් සමග චීන තායිවාන පළාතේ රන් අශ්වයා නම් සම්මානය හා චීන හොං කොං විශේෂ පරිපාලනයේ සිනමා සම්මානයේ හොඳ ම නව නළුවාගේ සම්මානය ජේ චෝ ලබා ගෙන තිබේ. 2007 වසරේ ජේ චෝ අධ්‍යක්ෂණය කළ රහස නම් චිත්‍රපටය තායිවානයේ





වාර්ෂික විශිෂ්ට චිත්‍රපටය බවට පත් විය.

ජේ චෝ සිනමා ක්ෂේත්‍රයේ සිය දක්ෂතා සාර්ථකව දක්වා තිබේ. එහෙත් සංගීතය අතින් ඔහු දක්වන දක්ෂතා ඊට වඩා පුදුම සහගතය. මේ වන විට චීන තායිවානයේ රන් ගීතය නම් සම්මාන 15ක්, ජනප්‍රිය ම චීන ගායකයා 8 වතාවක්, ලෝක සංගීත සම්මානයේ චීන ශාඛාවේ වැඩි ම නිර්මාණ අලෙවි වාර්තා තැබූ කලාකරුවා 4 වතාවක් ඇතුළු ගණන් කළ නොහැකි සම්මාන හා ගෞරවයන් රැසක් ඔහු හිමි කර ගෙන තිබේ.

ජේ චෝ අවංක ලෙස සංගීතයට ආදරය කරන අතර මිහිරි ගීත නිර්මාණය කිරීමට උත්සාහ කරමින් සිටී. සංගීතයට දක්වන උනන්දුව සහිත ජේ චෝ අඛණ්ඩව චීන සංගීතයට සිය දායකත්වය දක්වනු ඇති.





# මා ආත්මීයව ප්‍රියකරන චීනය

මාගේ දෙවැනි ගම ලෙස මම සලකන චීනයේ යුන්නාන් පලාතේ කුන්මින් නගරයේ වාර්ෂිකව සංවිධාන කෙරෙන දකුණු ආසියා වෙළඳ ප්‍රදර්ශනයට සහභාගී වීමට මට මුලින්ම අවස්ථාව ලැබුනේ 2012 වසරේදීය. එම ජීවන අත්දැකීම ස්වර්ණමය මොහොතක් වන්නේ එහිදී මට මුණ ගැසුන ශ්‍රී ලංකික පාසල් මිතුරෙකු නිසාවෙනි. එතැන් සිට ශ්‍රී ලංකාවේ තේ, කෝපි, කළු බඩු ඇතුළු අපනයන භාණ්ඩ චීන පාරිභෝගි කයන්ට සමීප කිරීමට මා ආත්මීයව ප්‍රියකරන චීනයේ බොහෝ නගරයන්හී සංචාරය කිරීමට මට සංසාරගත වාසනාව පෑදුණි.

මා ලද අත්දැකීම් දිග හැරෙන්නේ එතැන් සිටය. 2014 වසරේ නොවැම්බර් මාසයේ සීත කාලයෙන් වෙලී තිබූ චීනයේ සී ආන් නගරයට මා පැමිණියේ එහි පැවැත්වෙන කෘෂිකාර්මික ප්‍රදර්ශනයකට සහභාගි වීම සඳහාය. මා සී ආන් නගරයට ළඟා වූයේ චීනයේ ෂැංහයි නුවර හරහාය. සී ආන් හී ගත කළ කාලය මතකයේ රැදෙන සංචාරයකි. ඒ සී ආන් අවට ප්‍රදේශය චීනයේ මදක් පිටිසර බද කෘෂිකාර්මික ප්‍රදේශයක් වන නිසාවෙනි.

කෘෂිකාර්මික ආර්ථිකයකට හිමිකම් කියන ශ්‍රී ලංකාවේ සිට ගොස් සී ආන් නගරයේ ප්‍රධාන මාවත් දෙපසට පෙනෙන මානය පුරාවටම විහිදුන හරිතවත් වගාබිම් වල මනස්කාන්ත දසුන් දිගින් දිගටම දකින කල දෙරට අතර කෘෂිකාර්මික දියුණුවේ පරතරය අතර මම අතරමං වීමි. එක යායට එකම ආකාරයට සැකසුන එකම භෝගයේ වගාබිම් ඇසට පෙනෙන මානය පුරාවටම විහිදී තිබේ. මෙම භෝග අතර වී, මිදි, ඇපල්, ලොකු දෙළුම් කහ පැහැති දොඩම් සහ එළවළු වර්ග විය. ගොවි පවුල් පසුබිම හා කෘෂි ක්ෂේත්‍රයේ සම්බන්ධවී සිටින නිසා වගාබිම්වල මෙම දියුණු වාණිජමය ක්‍රමවේද සහ තාක්ෂණය ශ්‍රී ලංකාවේ ගොවීන්ට හදුන්වා නොදෙන්නේ මන්දැයි මට සිතිණ. ජල වහනය, පසු අස්වනු ක්‍රමවේද ආදිය මනාව දර්ශනය වූ මෙම වගාබිම් තුලින් සමස්ත චීනයට ආහාර සැපයීම අපහසු දෙයක් නොවන බව මට අවබෝධ විය. සී ආන් නගරයේ කුඩා මංමාවත් දෙපස වර්ණවත් පළතුරු, නැවුම් එළවළු වෙළඳසැල් මෙන්ම වීදි දෙපස උණුසුම් ආහාර සකසන කුඩා අවන්හල්ද පිරී තිබිණ.



හිමිදිරි උදෑසන මද මීදුමේ තුෂාරවන් සිහින් වැහි බිඳු සමඟ පැවති සීතල කාලගුණයේත් අති විශාල ගොවි ගෙවිලියෝ පිරිසක් කෘෂිකාර්මික ප්‍රදර්ශනය නැරඹීමට පෙළගැසී සිටියහ. තමන්ට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර හා භෝග මිලදී ගනිමින් මෙම දියුණු ප්‍රදර්ශනය අත්විඳින මෙම මදක් පිටිසර ගොවි ජනතාව හොඳ ආර්ථිකයකට හිමිකම් කියන ප්‍රබෝදවත් ජීවිත ගතකරන තෘප්තිමත් පිරිසකැයි මට සිතිණ. සංචාරක ස්ථාන, කෘෂිකාර්මික දියුණුව යනාදියට අමතරව එම ප්‍රදේශයටම ආවේණික ආහාර සඳහාත් සී ආන් නගරය ප්‍රසිද්ධියට පත්ව තිබේ. මස්වර්ග සහිත උණුසම් නූඩ්ල්ස්, අවේණික සුප් වර්ග ඒ අතර විය. වීදි දෙපස පේලියට සිටවූ සමාන මේපල් ගස්වල රන්වන් රත්පැහැගත් කොළ සීතල සුළඟට විසිරෙන, ඉඩ ඇති සෑම තැනකම තිරස්ව හා සිරස්ව ක්‍රමානුකූලව වවා ඇති මල් පැළ වල සීතලට මල් පිපෙන වීදි දිගේ ඇවිදීමට මම ප්‍රිය කළෙමි. ඒ කුඩා අවන්හල්වල රසවත් ආහාර රස විඳීමටත් විදේශිකයන් හා මිත්‍රශීලි වීමට කැමති ප්‍රියමනාප සී ආන් වැසියන් හා කුළුපග වීමට මා තුල වූ කැමැත්ත නිසාය.

මා හා සිනාසුන කථාකල හැම සී ආන් වැසයෙකුම පාහේ මා සමඟ ඡායාරූපයක් ගැනීමට ප්‍රිය කළහ. මමද ඔවුන් සමඟ මාගේ කැමරාවෙන් ඡායාරූප ගැනීමට අමතක නොකෙලෙමි. මීට වසර කිහිපයකට පෙර මෙම ප්‍රදේශයේ කළ මාගේ ප්‍රථම සංචාරයේ සමස්ත මතකයම එකම ඡායාරුවක් සේ මාගේ මතකයේ සනිටුහන් වී තිබේ.

රචනය: වසන්ත වරුසප්පෙරුම










# චීන මහා ප්‍රාකාරයේ රාත්‍රියක්

බොහෝ චීන වැසියන් මිත්‍රශීලිය. අවුරුදු 70-80 වයසේ පිරිස් ද මහ පවුර තරණය කරති. පවුර තරණය කරන්නට අපහසු පිරිස් කේබල් කාර් ඔස්සේ පරිසරය නරඹමින් එහි සංචාරය කරති. සමහරු පවුර දෙපයින් තරණය කර ඉන් බැසීම සඳහා කේබල් කාර් භාවිත කරයි. තවත් පිරිසක් පවුර නැගීමට කේබල් කාර් භාවිත කර දෙපයින් බසිති. ඔවුන් මෙම ක්‍රම දෙකම අනුගමනය කරන්නේ එමගින් ද්විත්ව අත්දැකීම් ලැබෙන බැවිනි. මේ යන අතරමඟ පවුරේ නිරීක්ෂන කුළුණු, හමුදා බැරැක්ක, සතුරන් හෝ ආක්‍රමණ පිළිබඳ රාහස්‍ය තොරතුරු හුවමාරු කරගත් සංඥා කුළුණු හා ආරක්ෂක බලකොටු යනාදිය ද නරඹන්නට හැකිය. පවුර තරණය කරන බොහෝ චීන වැසියන් චීන ජාතික ධජය ලෙළදෙවමින් එය තරණය කිරීම සාමාන්‍ය සිරිතකි.

අපි තරණය කළ බා ඩා ලිං ප්‍රාකාරයේ එක් කොටසක් ආලෝකමත් කර රාත්‍රී කාලයේ සංචාරකයන් සඳහා විවෘත කර ඇත. එසේම රාත්‍රී කාලයේ පවුරෙහි රැ යක් ගත කිරීම ට ද හැකිය. බොහෝ තරුණ කොටස් සඳ පායා ඇති රාත්‍රිවල එහි රැයක් ගත කිරීමට වැඩි කැමැත්තක් දක්වයි. මා සමඟ චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ අනෙකුත් විදේශ සේවාවන්ගේ සේවය කරන මිතුරු මාධ්‍යවේදීන් පිරිසක් සමඟ වරක් මහා ප්‍රාකාරයේ රාත්‍රියක් ගත කිරීමට ද මට අවස්ථාවක් ලැබිණ. වසන්ත කාලයේ පුන් පොහෝ දිනයක් වු එදින රාත්‍රියේ චීන මහා ප්‍රාකාරය නැමති විස්මිත නිර්මාණයේ සුන්දරත්වය මම අත්දැකීමෙන් ම වින්දෙමි. සඳ එළිය, හරිත පැහැ වනාන්තරය, පක්ෂීන්ගේ නාදය සමඟ ඇතිවන ස්වභාව ධර්මයේ ආස්වාදයේ අපූර්වත්වය එදින රස වින්දෙමි.

ලොව පුදුම හතෙන් එකක් නැරඹීමේ ආශාව නිසාත්, අප්‍රේල් මාසයේ සෞම්‍ය කාලගුණය නිසාත්, හරිත වර්ණයෙන් බබලන පරිසරයෙන් මහ පවුර හරහා හමා ගිය මද සුළඟ නිසාත් අපි තිදෙනා කිසිදු අපහසුතාවකින් තොරව චීන මහා ප්‍රකාරයේ බා ඩා ලිං හි මුදුන් කණුව දක්වා තරණය කෙළෙමු. එහි මදක් වීඩාව හැරී අපි රැගෙන ගිය කෙටි ආහාර අනුභව කොට යළි පවුරෙන් බසින්නට පටන් ගත්තේ දහසක් දේවල් පිළිබඳ කල්පනා කරමිනි.





මෙවැනි පවුරක් ඉදි කිරීමට කැප කළ මිනිස් ශ්‍රමය, එහි වපසරිය හා තාක්ෂණය සලකන විට මෙය ලෝක උරුමයක් වීමත්, ලොව පුදුම හතෙන් එකක් වීමත් අරුමයක් නොවන වග නම් සඳහන් කළ යුතුමය. 'චීන මහා ප්‍රාකාරයට නො නැංගේ නම් ඔබ සැබෑ මිනිසෙක් නොවෙයි' යන චීන කියමනෙහි සත්‍යතාව අපි විදින පසක් කර ගත්තෙමු.

සටහන: චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවයේ උපදේශක සුගත් රත්නායක









## පිබිදුණු පෞඪත්වය-චීනයේ අසිරියෙන් බිඳක්

# සෘතු හතරකට මැදි වූ බෙයිජිං අසිරිය

චීනය සතු හැකියාව අතිමහත්ය. භූමියෙන්, සංවර්ධනයෙන් නව තාක්ෂණයෙන් සැබෑවටම පොහොසත් වේ. සෑම දිශාවකම දක්නට ඇත්තේ අහස උසට නැඟී ඇති ගෘහ නිර්මාණ කලාවන්ය. ඒ අතර ඉහළට පහළට දිවෙන දැවැන්ත මාර්ග පද්ධතියත් මංමාවත් තුළ මලින් පිරුණු තණ නිල්ලත් උද්‍යානත් සැබෑ ලෙසම අපූරත්වයක් පරිසරය තුළ නිර්මාණය කර තිබේ. චීනයේ අද්දැකීම් ලැබූ කාලය වසර දෙකක් වුවද "මා දුටු චීන පෞඪත්වය" එක් ලිපියකින් ලියා අවසන් කළ නොහැකිය. එසේ වුවත් බෙයිජිංහී මා සිත් ගත් සුන්දර ඉසව් 4ක් ඔබ වෙනුවෙන් තෝරා ගත්තෙමි. මෙවර කලාපය තුළ සිත් සොරා ගත් අවස්ථා දෙකක් පිළිබඳව ලියන්නට සිත්විය.

ගිම්හාන නිවහන චීනයේ ප්‍රසිද්ධ ආකර්ෂනීය සංචාරක ස්ථානයක් වන අතර, බෙයිජිංහී මා සිත් සොරා ගත් විශේෂ සුන්දර ඉසව්වකි. ගංගාවක් මැද අපූරු පාලමකින් යා වෙන මේ නිවහන අතිශයින්ම සුන්දර ස්ථානයක් ලෙස පෙන්වා දිය හැකිය. ශීත කාලයේ එහි සුන්දරත්වය මීදුමත් සමඟ තවත් වැඩි වේ. සංචාරකයන්ට මකර බෝට්ටුවකින් ගඟ වටා ගොස් එම නිවහනේ පිටත ආකර්ෂණය නරඹන්නට ද හැකිය. මෙම නිවහන ඉස්මත්තේ බුදු මැදිරක් දක්නට ලැබේ. චීනයේ අධිරාජ්‍යයකුටත් වඩා බලසම්පන්න "ග්‍රේට් ලේඩි සිසි" නමින් හඳුන්වන සිසි අධිරාජිනිය සිය බොදු වත්පිළිවෙත් ඉටු කළේ මේ ස්ථානයේදී බව පැවසේ.

මෙහි අද්දැකීම නම් ටිකක් විඩා බර විය. එයට හේතුව වූයේ මාර්ගයේ ගමන් ගන්නේ නම් කන්දක් තරණය කිරීමට සිදුවීමයි. එය තරමක අපහසු වූයේ සමහර ගල් පඩි අතර පරතරය සීමා සහිත වීම නිසා වැටේ දෝ කියා සිතට නැගෙන බිය නිසා යැයි මට මේ මොහොතේ මතක් වේ. නමුත් ඉහළට නැගුණු පසු හාත්පසම දර්ශණීය ආකාරයෙන් දැකිය හැකිය. මනරම් හා අපූරු මතක සටහනක් මාගේ සිත් තුළ ඉතිරි කර වූහ. චීනයට ආවේනික අයිස් ක්‍රීම් වල රස බලන්නට ලැබුණේ ද මට මෙහිදීය. සීගිරි ගල තරණය කළා හා සමාන අද්දැකීමක් බවද කිවහැකිය.

චීනයේ තිබෙන්නේ රාජ්‍ය මාධ්‍ය පමණි. චීනයේ රූපවාහිනී මධ්‍යස්ථාන 19000ක් හා පුවත්පත් 2000ක් තිබේ. මා සේවය කරන්නේ චීනය සතු රාජ්‍ය ගුවන්විදුලි සේවයේය. චීන ජාත්‍යාන්තර ගුවන් විදුලි ආයතනයේ සිංහල සේවයේ. සැබෑම වාසනාව වූයේ මෙම මාධ්‍ය ආයතනය පිහිටා ඇත්තේ බෙයිජිං අගනගරයේ වීමය. එම නිසා අවට ඇති දැකුම්කළු ස්ථාන නැරඹීමේ වාසනාව මට හිමි විය.

අධිරාජ්‍ය යුගයේ ස්වර්ණමය උත්සව පැවැත්වූ දෙව්ලොව පන්සල සැබැවින්ම දෙව්ලොවකට සමාන වූ මාසිත් ගත් බෙයිජිංහී සිව්වෙනි මංසළයි.



පිහිටා ඇත්තේ වොන්ග්වන්වයි දිස්ත්‍රික්කයේ. චීනයේ පැරණි පූජනීය ගොඩනැගිලි අතර විශාලතම හා වඩාත්ම කැපී පෙනෙන වර්තමාන කෘතිය වන්නේ මෙම ස්වර්ණමය දේවස්ථානයය. 1420දී පළමුව ඉදි කරනු ලැබු මෙහි, “මින්ග් රාජවංශයේ” අධිරාජයා වූ “යොන්ග්ල් රජුගේ” පාලන සමයේ ඉතාමත් සශ්‍රීකව පැවති ස්ථානයකි. ඇත්තෙන්ම මෙය තහනම් මාලිගාවට වඩා භූමියෙන් විශාල වේ. වසර 1988දී එය මහජන උද්‍යානයක් වශයෙන් ප්‍රසිද්ධියට පත්කර තිබේ. පුරාණ දර්ශනය, ඉතිහාසය හා ආගම මේ තුළ ප්‍රදර්ශනය කෙරේ. පුරාණ නැගෙනහිර ශිෂ්ටාචාරයේ සාම්ප්‍රදායික වත්පිළිවෙත් හා විස්මිත වස්තු විද්‍යාත්මක ස්වරූපයන් ගැඹුරින් අධ්‍යනය කිරීමට මෙහිදී හැකිය. භූමි ප්‍රමාණය අනුව ගත් කළ වර්ග සැතපුම් 2700000ක් ආවරණය කෙරේ. මැද සරත් සමයේ නෙළා ගන්නා අස්වැන්නේ අග්‍ර ඵලය බුදුන්ටත් දෙවියන්ටත් පූජා කෙරෙන්නේ මෙහිදීය. අධිරාජ්‍යා විසින් බුදුන් වැද සූර්ය නමස්කාරය සිදුකළ ස්ථානය වශයෙන් ද සැළකේ. යහපත් අස්වැන්නක් සඳහා කන්නලව් සිදු කරන ශාලාවේදී ලැබූ අද්දැකීම විශ්මය ජනකය. එහි පැමිණි සංචාරකයින් පොර බදිමින් බිත්තයට යමක් කියන බව මට වටහා ගැනීමට හැකි විය. මොහොතක් බලා සිටි මම ද බිත්තියට ලංවී යමක් ප්‍රකාශ කළෙමි. පුදුමය ඒ බිත්තිය මා සමඟ කතා කරන්නාක් මෙන් නැවත එම ශබ්දයම පෙරළා ඇසෙන්නට විය.

දර්ශණීය ස්ථාන 4ක් පිළිබඳ ලියන බවට පොරොන්දු වුවද මේ සටහනත් තැබිය යුතු මැයි මට සිතේ. ඒ නිසා මේ ගැන නොලියා මේ සටහන අවසන් කළ නොහැකිය. බෙයිජිංහි වයඹ දෙසින් පිහිටා ඇති දිගු ඉතිහාසයක් හා පුරාණ පන්සල් මෙන්ම මනරම් දර්ශන සහිත ප්‍රසිද්ධ ගමනාන්තයක් මට හමු විය. එය පූජනීය බෞද්ධ විහාරස්ථානයක් වන “බාදාචූ” විහාරයයි. කිසිදා මා හට අමතක කළ නොහැකි සිතට පුදුමාකාර අස්වැසිල්ලක් ලඟා කරන්නා වූ සුන්දර ශාන්තිය කැටි වූ මනරම් කඳු වලල්ලක පහස විදින ඉසස්වකි. ලොව පිළිගත් බෞද්ධ මතය අනුව ගෞතම බුදුන්ගේ දන්ත ධාතූන් වහන්සේ නමක් වැඩ සිටින එක් ස්ථානයක් මෙයයි. ශ්‍රී ලංකාවේ කන්ද උඩරට ශ්‍රී දළඳා මාලිගයේ වැඩිසිටින ධන්ත ධාතූන් වහන්සේ වැඳපුදා ගැනීමට භාග්‍ය ලද මා හට එම අද්දැකීම චීනයේදී ද විදින්නට පිංකර තිබීම පිළිබඳ හිතේ ඇත්තේ නිහතමානී ආඩම්බරයකි.

මේ සටහන ගෙන හැරපෑවේ දැවැන්ත චීන රාජ්‍යයේ ඉතිහාසය කියා පෑ පෞරාණික ස්ථානයන් අතුරින් අංශුවක් පමණි. මෙහි අනෙකුත් සිත් සොරාගත් ස්ථාන දෙක පිළිබඳ ඊළඟ සඟරා වෙළුමෙන් බලාපොරොත්තු වන්න.

නිසංසලා රත්නායක - උපදේශක
චීන ජාත්‍යාන්තර ගුවන් විදුලියේ සිංහල සේවය













# සිවුවාන් හි අලුතින් පිබිදුණු 'ෂිංග්ෆු' ගම්මානය

ගැමිඅසිරියට අල්ප හෝ හානියක් නොවන පරිදි, ගම සංවර්ධනය පිළිබඳව හොඳම සාක්ෂියක් පසුගියදා චීනයේ සිචුවාන් පලාතේදී හමුවිය. ඒ 'ෂිංග්ෆු' නම් වූ ඉපැරණි ගම්මානයයි. ගම සංවර්ධනය කිරීමට වෙහෙසෙන ඕනෑම රටකට එම පාඩම 'ෂිංග්ෆු' ගම්වාසීන් විසින් ආකර්ශනීයව කියාදෙයි. ඉපැරණි ග්‍රාම සංස්කෘතියට කිසිදු හානියක් නොවන පරිදි මෙම ගම්මානය තිරසර සංවර්ධනයේ රුවගුණ නංවා තිබේ.

චීනයේ ගම්මානවල දියුණුව පිළිබඳව මීට පෙර තොරතුරුමය අත්දැකීමක් මා විසින් අසා තිබිණ. යුන්නාන් පලාතේ 'මං-චිං' නම් පිටිසර ගම 2001 වර්ෂය වන විට ලෝකයේ දුප්පත්ම ගම්මාන 100න් එකක් විය. මෙම ගම අතිශය ප්‍රසිද්ධ වුයේ තේ වගාවටය. තේ වගාව සඳහා නව ක්‍රම වැරදි ලෙස හඳුන්වා දීම නිසා ඔවුන්ගේ දුප්පත්කම වැඩි වී තිබිණ. නමුත් වසර 2003දී ගමේ ජනතාව එක් වී ඉපැරණි තේ වගාව සුරැකීමේ සංවිධානය නමින් සංවිධානයක් බිහි කර ගත්හ. තේ වගාව යනු මෙම ගමේ සංස්කෘතියේ අඩිතාලමය. රසායනික ක්‍රම නතර කොට සංස්කෘතිය ද සුරකිමින් පෙර තිබූ ආකාරයෙන් ම තේ, අකාර්ශනිය ඇසුරුම් ආදිය උපයෝගී කරගෙන වෙළඳ පොළට නිකුත් කළේ, මෙම සංවිධානය බිහිකිරීමෙන් පසුවය. අද 'මං-චිං' ගම සංස්කෘතිය ද සුරැකුණ ඉතා දියුණු ගමකි. සිචුවාන් හි 'ෂිංග්ෆු' ගම්මානය සියැසින් දැකීමෙන් චීනයේ ග්‍රාමීය ප්‍රදේශ දියුණු කිරීමේ ක්‍රමානුකූල බව මනාව තහවුරු විය.

පවුල් 61කට අයත් 200ක පමණ ගම් වැසියෝ පිරිසක් මෙහි සුවසේ වාසය කරති. ටැංග් සහ සොංග් යන රාජ වංශ වලට අයත් මෙම ගම ඉපැරණිය. මනරම් කඳු පංතිය හා ඒ හා බැඳුණු ජල මූලාශ්‍ර එහි සශ්‍රීකත්වයට මූලික යැයි සිතේ. ෂිංග්ෆු වෙත පිවිසෙත්ම දැණුනේ ගමකට නොව උද්‍යානයකට පිවිසෙන බදු හැඟීමකි. එතරම් සුන්දරය. ගැමියන්ගේ පවතින නිහතමානී ගුණය හා අමුත්තන්ට පුද සත්කාර කිරීමේ උවමනාව ඔවුන් තුල ඇති සතුටට සාක්ෂියකි. මෑත දිනක චීන විවිධ ප්‍රසංගයක් නරඹන අවස්ථාවක ඇසුණු ගීතයක 'මේ ජීවිතය කෙටිය. සතුටින් දිවි ගෙවිය යුතුය.' යනාදී අර්ථයක් ඇති බව මාගේ සහායක චීන මිත්‍රයා පැවසීය. මෙම ගැමියන් අසල දී එම ගීත රාවය යළි සිහි විය.



චීනයේ ප්‍රතිසංස්තරණ හා විවෘතභාව ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කර මෙම වසරට වසර 40ක් ගතවේ. එම කාලයේ දී ගු්‍රාම සංවර්ධනය සඳහා ගන්නා ලද වැඩපිළිවෙළ සාර්ථක අවසානයකට ළඟා වෙමින් තිබේ. ෂිංග්ෆු ගම්මානය ද එහි ප්‍රතිඵලයකි. ගම සමඟ බොහෝ දෙනෙකු සිතන්නේ එහි එකම ජීවනෝපාය කෘෂිකර්මාන්තය ලෙසය. එහෙත් චීනය එය තවත් කෝණයකින් බලා තිබේ. ග්‍රාමීය සංචාරක කර්මාන්තය එහිදී කැපී පෙනේ. මනරම් පරිසරය සිතට සුවදායි ය. රටාවට වවා ඇති එළවළු පළතුරු මගින් ලැබදෙන්නේ ආදායමක් පමණක් නොවේ. එයින් ගැමි අසිරිය තව තවත් වර්ණවත් කරයි. එමෙන්ම එය සංචාරක ආකර්ශනයක් ද ඇති කරවයි. ගැමිකමින් පිරුණු ගිමන් හල්, අවන් හල් ද තනා තිබේ. ගමේ පිහිටීමට හෝ පවතින කිසිදු සම්පතකට අල්ප හෝ හානියක් සිදුකර නැත. ඒ සියල්ලම ආකර්ශනයට පෙරළාගෙන තිබේ. එනයින් චීනයේ බොහෝ නව පිබිදුම් ගම්මානවල කෘෂිකාර්මික ආදායමට වඩා ග්‍රාමීය සංචාරක කර්මාන්තය හරහා ලැබෙන ආදායම වැඩිවී තිබේ. ෂිංග්ෆු ගම්මානය තුල කෘෂිකාර්මික හා සංචාරක නවීකරණ සිදුකර එය සංචාරකයින් සඳහා විවෘත කළේ 2016 වසරේදී ය. එතැන් සිට මාස දෙකක් ඇතුලත පැමිණි දේශීය හා විදේශීය සංචාරක පිරිස 48000කි. එයින් යුවාන් මිලියන හතරක් උපායා ගෙන තිබේ. වසරක් ඇතුලත දී ෂිංග්ෆු වැසියන්ගේ ආදායම 30% වැඩි විය. එහි කලින් බාහිර කිසිවෙකු හෝ නොදන්නා ගැමි සංස්කෘතියකි. දැන් එය සුරැකී ඇතිවා මෙන්ම ජනප්‍රිය ද වී ඇත. දහස් ගණන් ජනතාවගේ ආකාර්ශනටය බදුන් වී ඇත. ගැමි සුන්දරත්වය, සංස්කෘතික සුරක්ෂාව, මුදල් ඉපයීම, ජනප්‍රියත්වය, එම ජනතාවගේ සැහැල්ලුව යනාදිය දැන් මෙම ගම තුලින් බිහිවී තිබේ. දරුවන්ගේ අධ්‍යාපනය තුළ ඇත්තේ ද අලුත් මුහුණුවරකි. ඉංග්‍රීසි භාෂාවෙන් කෙනෙකු සමග කතා බහ කිරීමට හැකි කිහිපදෙනෙකුම දැන් මේ ගම තුළ වාසය කරයි. මේ සියල්ල සිදුව තිබෙන්නේ වසර දෙකක් වැනි කෙටි කාලයක් තුළ දී ය. චීනය තුළ පහළ සිට ඉහළට සිදුවන තිරසර සංවර්ධන ක්‍රියාකාරිත්වයේ සාර්ථකත්වය මෙවන් ප්‍රයත්නයන් තුලින් කැපී පෙනේ.

සටහන: ෂෙල්ටන් බණ්ඩාර











# අසන්නන්ගේ බිත්ති පුවරුව

ඉදිරිපත් කිරීම : හාඕ ලී ෆාං














# 《每日汉语》එදිනෙදා චීන බස

## 在旅行社 - සංචාරක ඒජන්සියේදී

### 今日关键 අද පාඩමෙන් අවධානය

有没有去云南的路线？
යො මෙ යො චු යුන් නන් ද ලු ෂැන්?
යුන් නන් පළාතට යන ගමන තියෙනවා ද?

你们一定不会失望的。
නි මෙන් ඉ දින්ග් බු හුයි ෂ් වන්ග් ද.
ඔබ නිසැකවම කණගාටු වන එකක් නැහැ.

我希望日程不要太紧。
වො ෂී වන්ග් ර් චන්ග් බු යඕ තයි චින්.
වැඩ කාර්ය බහුල කාල සටහනක් නොවේ යැයි මා බලා-පොරොත්තු වෙනවා.

我想多去些地方。
වො ෂයන්ග් දො චු ෂැන් දි ෆාන්ග්.
මට අවශ්‍යයි බොහෝ ස්ථාන වලට යන්න.

哪儿卖纪念品？
නා ර් මයි ජී නියැන් පින්?
සමරු භාණ්ඩ මිලදී ගත හැක්කේ කොහෙන්ද?

### 完整对话 සම්පූර්ණ සංවාදය

#### 对话一 පළමු සංවාදය

A：有没有去云南的路线？
යො මෙ යො චු යුන් නන් ද ලු ෂැන්?

යුන් නන් පළාතට යන ගමන තියෙනවාද?

B：有，五月一号出发，七号返回北京。
යො, වු යුඈ ඉ හඕ චු ෆා, චී හඕ ෆන් හුයි බෙ ජින්ග්.

තියෙනවා, මේ මාසයේ පළමු වැනිදා පිටත් වෙනවා. හත්වැනිදා බෙයිජිං නගරයට ආපහු එනවා.

#### 对话二 දෙවන සංවාදය

A：那个地方风景好吗？
නා ග දි ෆාන්ග් ෆොං ජින්ග් හඕ මා?
එහි දර්ශනය ලස්සනද?

B：放心吧。你们一定不会失望的。
ෆාන්ග් ෂින් බා, නි මෙන් ඉ දින්ග් බු හුයි ෂ් වන්ග් ද.
බය වෙන්න එපා, ඔබ නිසැකවම කණගාටු වෙන එකක් නැහැ.

#### 对话三 තෙවන සංවාදය

A：我希望日程不要太紧。
වො ෂී වන්ග් ර් චන්ග් බු යඕ තයි චින්.
වැඩ කාර්ය බහුල කාල සටහනක් නොවේ යැයි මම බලාපොරොත්තු වෙනවා.

B：当然，旅游是为了休息和放松。
දන්ග් ර්ඇන්, ලුයි යො ෂී වේ ල ෂ්‍යො ෂී හ ෆාන්ග් සොන්ග්.
ඒකනේ, විනෝදය හා විවේකය සඳහා තමයි සංචාරය කරන්නේ.

#### 对话四 සිව්වන සංවාදය

A：我想多去些地方。
වො ෂයන්ග් දො චු ෂැන් දි ෆාන්ග්.
මට අවශ්‍යයි ගොඩක් ස්ථාන වලට යන්න.

B：没问题，我帮你安排。
මේ වැන් ති, වො බාන්ග් නි අන් පයි.
ප්‍රශ්නයක් නැහැ. මම ඔයාට එය සැළසුම් කරන්න උදව් කරන්නම්.

#### 对话五 පස්වන සංවාදය

A：哪儿卖纪念品？
නා ර් මයි ජී නියැන් පින්?
සමරු භාණ්ඩ මිලදී ගත හැක්කේ කොහෙන්ද?

B：一直往前走就能看到了。
යී චි වන්ග් ඡයැන් සො චු නෙං කැන් දඕ ල.
ඉස්සරහට ගිහින් බලන්න පුළුවන්.

**චීන සංස්කෘතියෙන් බිඳක්**

චීනයේදී පොල්කිච්චන් සලකන්නේ වාසනාවේ පක්ෂියා ලෙසයි. වසන්තය එළඹෙන විට ගස් අතුමත එකතුවන පොල්කිච්චන් නාද නගනවා. මේ කුරුළු හඬ ඇසෙන විට චීන මිනිසුන්ට සතුටක් දැනෙනවා. ඔවුන් කියන්නේ පොල්කිච්චන් සුබ ආරංචි ගෙන එන බව. පොල්කිච්චන්ගේ හඬ දෙසවනට මිහිරක් ගෙනෙනවා පමණක් නෙවෙයි, සුබ ආරංචි පෙර පැවසීමක් ලෙසත් අමුත්තන්ගේ පැමිණීම හැඟවීමක් ලෙසත් චීන මිනිසුන් සිතනවා.

චීන ජනශ්‍රැතියේ පොල්කිච්චන් පිළිබඳ සිත සසලවන කතාවක් තිබෙනවා. සෑම වසරකම චන්ද්‍ර මාස ලිත් ක්‍රමයට අනුව ජුලි 7වැනිදා, ගොපල්ලකු හා පෙහෙකම් ලියක වන ඔහුගේ බිරිඳ අහසේදී හමුවන දිනයයි. ගොපල්ලාට සිය ආදරණීය බිරිඳ හමුවීමට ක්ෂීරපථය හරහා ගමන් කිරීම සඳහා පොල්කිච්චන් දහස් ගණනක් පියාසර කරමින් පාලමක් සේ පෙළ ගැසෙනවාලු. චීන මිනිසුන් මේ කුරුළු පාලමට කියන්නේ "චු චිඕ" කියලා. "පොල්කිච් පාලම" එහි අරුතයි. මෑත කාලයේ විවාහ මංගල ආයතන හා රූපවාහිනී වැඩසටහන් වලදීත් සෙසු විවාහ යෝජනා ක්‍රියාකාරකම් වලදීත් "චු චිඕ" යන නාමය නිතරව සඳහන් වෙනවා.



# 《每日汉语》එදිනෙදා චීන බස

## 在邮局 - තැපැල් කාර්යාලයේදී

ඉදිරිපත් කිරීම:
සුන් ජියෑන් චාඕ



### 今日关键 අද පාඩමෙන් අවධානය

请问，邮局在哪？
චින්ග් වෙන්, යො චු සයි නා?
කරුණාකර මට දැනගන්න පුළුවන් ද තැපැල් කාර්යාලය කොහේ ද තියෙන්නේ කියලා?

我要寄包裹。
වො යඕ චී බඕ ගො.
මට දැන් පාර්සලයක් යවන්න ඕන.

多长时间能到？
දො චන්ග් ෂ ජියැන් නෙන්ග් දඕ?
කොපමණ කාලයකින් ඒ පාර්සලය ලැබෙයිද?

我要取包裹。
වො යඕ චු බඕ ගො.
මට දැන් එම පාර්සලය අරගෙන යන්න ඕන.

我要买几张明信片寄给朋友。
වො යඕ මැයි චි චන්ග් මින්ග් ෂින් පියැන් චී ගේ පෙන්ග් යො.
මට තැපැල් පත් කිහිපයක් මිලදී ගෙන මගේ යහළුවන්ට යවන්න ඕන.

### 完整对话 සම්පූර්ණ සංවාදය

#### 对话一 පළමු සංවාදය

A：请问，邮局在哪？
චින්ග් වෙන්, යො චු සයි නා?
කරුණාකර මට දැනගන්න පුළුවන්ද තැපැල් කාර්යාලය කොහේද තියෙන්නේ කියලා?

B：就在前面拐角处。
චු සයි චියැන් මියැන් ගුඅයි ජිඕ චු.
ඉස්සරහ කෙළවරේ තියෙනවා.

#### 对话二 දෙවන සංවාදය

A：我要寄包裹。
වො යඕ චී බඕ ගො.
මට දැන් පාර්සලයක් යවන්න ඕන.

B：寄到哪？
චී දඕ නා?
කොහේට ද යවන්නේ?

A：寄到香港。
චී දඕ ෂියන්ග් ගන්ග්.
හොංකොං වලට යවන්න ඕන.

#### 对话三 තෙවන සංවාදය

A：我要寄包裹去香港，多长时间能到？
වො යඕ චී බඕ ගො චු ෂියන්ග් ගන්ග්, දො චන්ග් ෂ ජියැන් නෙන්ග් දඕ?
මට පාර්සලයක් හොංකොං වලට යවන්න ඕන. එම පාර්සලය ලැබෙන්න කොපමණ කාලයක් යයි ද?

B：最少两个星期。
සුයි ෂඕ ලියං ග ෂින්ග් ඡී.
අඩු ගාණේ සුමාන 2ක් ඕන.

#### 对话四 සිව්වන සංවාදය

A：我要取包裹。
වො යඕ චු බඕ ගො.
මට එම පාර්සලය අර ගන්න ඕන.

B：请给我看一下你的包裹单和护照。
චින්ග් ගේ වො කාන් ඉ ෂිඅ නි ද බඕ ගො දැන් හ හු චඕ.
කරුණාකර ඔයාගේ පාර්සලේ කුවිතාන්සිය හා ගමන් බලපත්‍රය මට දෙන්න.

#### 对话五 පස්වන සංවාදය

A：我要买几张明信片寄给朋友。
වො යඕ මයි චි චන්ග් මින් ෂින් පියැන් චී ගේ පෙන්ග් යො.
මට තැපැල් පත් කිහිපයක් මිලදී ගෙන මගේ යහළුවන්ට යවන්න ඕන.

B：恩，印有长城和故宫的很合适。
අන්, යීන් යො ඡන්ග් චෙන්ග් හ ගු ගාන්ග් ද හන් හ ෂී.
ඔව්, චීන මහා ප්‍රාකාර හෝ තහනම් මාලිගාවේ පින්තූර සහිත තැපැල් පත් නම් හොඳයි.

**චීන සංස්කෘතියෙන් බිඳක්**

චීනයේ තැපැල් කාර්යාල වලදී සිදුවන්නේ ලිපි, පාර්සල යැවීම, යම් ගෙවීම් සිදු කිරීම හෝ තැපැල්පත් හා මුද්දර මිලදී ගැනීමයි. ඒ වගේම දුරකථන බිල්පත් ගෙවන්නටත් ඉතිරි කිරීමේ ගිණුම් අරඹන්නටත් සෙසු පුද්ගලික ඉතිරි කිරීමේ සේවා පවත්වා ගැනීමටත් මිනිසුන්ට එහිදී හැකි වෙනවා. වසර ගණනාවක සංවර්ධනයෙන් පසු තැපැල් ඉතිරි කිරීමේ ක්‍රියාව, චීන සිල්ලර මූල්‍ය වෙළඳ පෙළෙහි වැදගත් කොටසක් බවට ද පත්ව තිබෙනවා. මෑත වසරවලදී ජනතාවගේ ජීවන තත්වයන් වර්ධනය වීමත් සමගම තැපැල් කාර්යාල සිය ව්‍යාපාරික කටයුතු නොකඩවාම පුළුල් කර තිබෙනවා. උදාහරණයක් හැටියට චීන සාම්ප්‍රදායික උත්සවයක් වන මැද සරත් - සෘතු උත්සවයේදී ජනතාවට තැපැල් කාර්යාලයෙන් "යුඈ බින්ග්" හෙවත් සඳකේක් ඇණවුම් කර තමන්ගේ සමීප මිතුරන් හා ඥාතීන් වෙත සුබ පැතුම් සමග යවන්නට පුළුවන්.

**පි**සුගිය පාඩම් හතරකදී ADELBOTS ප්‍රථමාධාර ක්‍රමවේදය ද ඇතුළත් විවිධ තුවාල අවස්ථා කිහිපයකදී කළ යුතු ප්‍රථමාධාර ක්‍රමශිල්ප ගණනාවක් සාකච්ඡා කළෙමු. මෙවර පාඩමෙන් තැලුම් තුවාල, දතක් ගැලවී යාම සහ කනෙන් ලේ ගැලීම යන අවස්ථාවලදී කළ යුතු ප්‍රථමාධාර පිළිබඳව දැනගනිමු.

# විවිධ තුවාලවලදී ප්‍රථමාධාර

## 14 වන පාඩම

## තැලුම් තුවාල - Bruise Wound

සිරුර කිසිවක ගැටීම නිසා හෝ සිරුරට යමක් වැටීම හෝ තද වීම නිසා ඇතිවිය හැකි තැලුම් තුවාල නිසා සම තුළ හෝ සමට යටින් ඇති පටකවලට රුධිර වහනය වීම සිදුවේ. එවිට ඉදිමීම හා රත් පැහැගැනීම සිදුවන අතර, පසුව තැලුණු ප්‍රදේශය නිල් හෝ කළු වර්ණයට හැරේ. තැලීමක් සිදු වී පැය කිහිපයකට පසුව හෝ දින කිහිපයකට පසුව වුවද මෙම රෝග ලක්ෂණ හා නිමිති ප්‍රදර්ශනය විය හැකිය. නිසි ප්‍රථමාධාර ඉක්මනින් ලබාදීම මගින් ඉදිමීම පාලනය කොට වේදනාව අවම කළ හැකි වේ.

**ප්‍රථමාධාරයේ අරමුණ!**
ඉදිමුම අඩු කර ගැනීම සඳහා එම ස්ථානයට රුධිර සැපයුම සීමා කිරීම

### කළ යුතු දේ

- **හැකිනම් තැල්ම වූ ප්‍රදේශය හෘද මට්ටමට වඩා එසවී තිබෙන පරිදි රෝගියාට පහසු ඉරියව්වකින් තබන්න.**
- **තැලීමට ලක්වූ ස්ථානය සිසිල් පෑඩයකින් (Cold Pad) හෝ අයිස් බෑගයකින් (Ice Pack) විනාඩි 10 ක් පමණ සිසිල් කරන්න.**
  අයිස් හෝ ශීතකරණයක තබන ලද ජලය, අයිස් පැකට් හෝ අයිස් ක්‍රීම් වැනි ඕනෑම සිසිල් දෙයක් පොලිතින් උරයකින් හෝ රෙදි කඩකින් ආවරණය කොට තැල්ම වූ විගස එම ස්ථානය සිසිල් කළ යුතුය. එමගින් එම ස්ථානය සිසිල් වීම නිසා හානි වූ පටක හැකිළීම හේතුවෙන් පටක තරලය මුදා හැරීම අවම වීමත්, රුධිර නාල හැකිළීමෙන් එම ප්‍රදේශයට රුධිර සැපයුම අඩු කිරීමත්, එම නිසා වේදනාව හා ඉදිමීම අඩුවීමත් මෙමගින් සිදු වේ.






- සිසිල් කළ පසු, තැලුම් සිදු වූ අවයවය හෘද මට්ටමට වඩා මඳක් ඉහළ එසවී තිබෙන පරිදි **විවේකීව තබන්න.**
- විශේෂිත ඉන්ද්‍රියක් අසල හෝ ඉන්ද්‍රියේම සිදුවූ තැල්මකදී හෝ බරපතළ තැලුම් තුවාලයකදී **වෛද්‍යාධාර සඳහා යොමු කරවන්න.** (උදාහරණ ලෙස - මුහුණට ඇති වූ පහරකදී ඇසෙන් කඳුළු ගැලීම)

තැල්මක් ඇති වූ විට උණුසුම් පොට්ටනියක් භාවිතයෙන් හෝ අත තබා රත් වන තුරු පිරිමැදීම මගින් හෝ බාම් වර්ග ආලේප කොට තවදුරටත් තැලුම් තුවාලය මත පීඩනය යොදා තැලීමෙන් වළකින්න



## දතක් ගැලවී යාම

වැඩිහිටියෙකුගේ දතක් හෙවත් ද්විතීක දතක් ගැලවී ගියවිට හැකි ඉක්මනින් දත ගැලවී ගිය කුහරය තුළ යළි රුඳවිය යුතුය. එසේ කළ නොහැකි නම්, රෝගියාගේ මුඛයේ කම්මුල ඇතුළු පැත්තෙන් තබා ගැනීමට හෝ කුඩා දරුවන්ගේ දතක් ගැලවුණු විටක කළ යුතු පරිදි කිරි වීදුරුවක දමා එහි තෙතමනය ආරක්ෂා කර ගනිමින් දන්ත වෛද්‍යවරයෙකු වෙත රැගෙන යා යුතුය.

**අවවාදයයි!**
ගැලවුණු දතෙහි ඇති පටකවලට හානි වීමටත්, යළි සවි කළ නොහැකිවීමටත් හේතු වන නිසා ගැලවුණු දත පිසදැමීමෙන් හෝ සෝදා හැරීමෙන් වළකින්න.



### කළ යුතු දේ



- රෝගියා අස්වසන්න, අවබෝධ කර දෙන්න
- රෝගියා වාඩි කරවන්න
- ගැලවුණු දත නිවැරදිව අදාළ කෙවෙනිය තුළ රඳවන්න
- දත නිවැරදි ආකාරයෙන් තබා ගැනීමට ඉහළ හා පහළ දත් අතර ගෝස් පෑඩයක් තබන්න
- නැවත දත එය තිබූ කෙවෙනිය තුළ රැඳවිය නොහැකි නම් හක්ක තුළ හෝ නැවුම් කිරිවල හෝ පිරිසිදු ජලය ස්වල්පයක දමා සුරක්ෂිත කරගෙන රෝගියා දන්ත වෛද්‍යවරයෙකු වෙත යොමු කරවන්න
- කුඩා දරුවන්ට ගැලවුණු දතක් එය තිබූ කෙවෙනිය තුළ හෝ මුඛයේ රඳවා තබා ගැනීමට අපහසු හෝ නොහැකි විය හැකි නිසා, එය නැවුම් කිරිවල හෝ පිරිසිදු ජලය ස්වල්පයක තබා රැගෙන යාම උචිතය. නැතහොත් එය වියළීමට ලක්වී, නැවත සවි කිරීමට ඇති හැකියාව අහිමි වනු ඇත.
- මුඛයෙන් රුධිරය වහනය වුවද මුඛය සෝදා හැරීමෙන් හා රෝගියා දත සමඟ දන්ත වෛද්‍යවරයෙකුට යොමු කිරීම පමා කිරීමෙන් හා ගැලවුණු දත වියළීමට ඉඩහැරීමෙන් හා දතෙහි මූලය අනවශ්‍ය ලෙෂ ස්පර්ශ කිරීමෙන් වළකින්න.

**සැලකිලිමත් වන්න!**
ගැලවුණු දතක කුහරයෙන් රුධිරය නොනවත්වා ගලන්නේ නම්, හා දත කුහරයට තබා රැඳවිය නොහැකි නම්, ගෝස් කැබල්ලක් කුහරය මත තබා අනෙක් ඇන්දේ දත්වලින් එය සපාගෙන තද කරගෙන සිටින ලෙස දන්වන්න. වහාම දන්ත වෛද්‍යවරයෙකු හමුවන්න.

## කනෙන් ලේ ගැලීම

කනෙන් රුධිර වහනය වීමට බලපාන හේතු සාධක ලෙස කන්බෙරයට හානි පැමිණීම, කනේ ඇතිවන ආසාදන තත්ත්වයන්, මොළයේ සිදු වන අභ්‍යන්තර රුධිර වහනයක් ආදී විවිධ සාධක බලපායි.



### රෝග ලක්ෂණ හා නිමිති -

- රුධිරය ගලා ඒම
- කන් ප්‍රදේශය අඳුරු පැහැයක් ගැනීම
- තියුණු වේනාව සමඟ එන කන් කැක්කුම
- කන් ඇසීමේ දුර්වලතාවය
- කරකැවිල්ල
- අභ්‍යන්තර රුධිර වහනයක ලක්ෂණ හා නිමිති

### කළ යුතු දේ -

- **රුධිර වහනය වන කන එම පැත්තටම ඇලකර රෝගියා හාන්සි කොට තබා ගන්න.**
- **විෂබීජවලින් තොර, ලොම් රහිත මෘදු පෑඩයක් කන මත තබන්න**
- **ජෛව ක්‍රියාවලීන් පිළිබඳ විමසිලිමත් වෙමින් රෝගියා රෝහලක් වෙත ප්‍රවාහනය කරන්න**

**සැලකිලිමත් වන්න!**
- රුධිර වහනය වන විට කනට කිසිවක් ඇතුළු නොකරන්න.
- වෛද්‍ය උපදෙස් ලැබෙන තෙක් වේදනා නාශක හෝ ආහාරපාන වර්ග ලබා දීමෙන් වළකින්න.

ඉදිරි පාඩම්වලදී තවත් විවිධ සංකීර්ණ තුවාලවලින් රුධිර වහනය වීමකදී කළ යුතු ප්‍රථමාධාර පිළිබඳව සාකච්ඡා කරමු.

මෙම ප්‍රථමාධාර ක්‍රමශිල්ප එදිනෙදා ප්‍රායෝගිකව භාවිතා කිරීම සඳහා විධිමත් ප්‍රථමාධාර පුහුණුවකට සහභාගී වීම අත්‍යවශ්‍ය වන අතර මෙම තොරතුරු කියවීම පමණක් ප්‍රථමාධාර ලබාදීමට ප්‍රමාණවත් හැකියාවක්, දැනුමක් හා විශ්වාසයක් ලබා නොදෙයි. ජීවිතයට අතිශය වැදගත් මෙවැනි ප්‍රථමාධාර ක්‍රමශිල්ප පිළිබඳ විධිමත් ප්‍රථමාධාර පුහුණුවක් ලබා ගැනීමේ අවස්ථාව ශ්‍රී ලංකා රතු කුරුස සමාජය මගින් ඔබට ලබා ගත හැක. ඒ පිළිබඳ තොරතුරු සඳහා www.redcross.lk වෙත පිවිසෙන්න. කතා කරන්න 0115347000.

# ශ්‍රී ලංකා රතු කුරුස සමාජය
# ගං වතුරින් විපතට පත් වුවන් සඳහා මූල්‍යාධාර සපයයි








පසුගියදා ඇති වූ ගං වතුරින් විපතට පත්වූවන් සඳහා ශ්‍රී ලංකා රතුකුරුස සමාජය රු. 10,000 බැගින් වූ මූල්‍ය ප්‍රතිපාදනයක් කොළඹ , කළුතර, රත්නපුර, පුත්තලම, කුරුණෑගල, ගම්පහ සහ කෑගල්ල යන දිස්ත්‍රික්කයන්හි පවුල් 2800ක් සඳහා ප්‍රදානය කරන ලදී.

විපතට පත්වූවන් එදිනෙදා මුහුණ දෙන ගැටළු සඳහා කොන්දේසි විරහිතව මෙම ප්‍රතිපාදන ලබාදීමට කටයුතු කර ඇත.




| | Frequency | Time (Sri Lanka) | |
|---|---|---|---|
| FM | CRI - Sri Lanka FM97.9 | 05.00-10.00 (Eng) | 10.00-00.00 (Sin) |
| Short wave | 7260/9490/7265/11900 | 19:30-20:30 | 05:00-06:00 |
| Online | http://sinhalese.cri.cn/ | | |

# චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය

ශ්‍රී ලංකා ජන ජීවිතය මැනවින් හඳුනාගත් සුහද මිතුරෙකු ලෙස චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය ඉදිරි ගමනක් ආරම්භ කර තිබේ. ශ්‍රී ලංකාව පුරා විසුරුවා හැරෙන කෙටි තරංග සහ බස්නාහිර පළාත ආවරණය කරන FM තරංග විකාශනයක් සිංහල සේවය සතුවෙයි. සියළු වැඩසටහන්වලට පොඩ්කාස්ටින් සේවාව ඔස්සේද සවන් දිය හැකිය.

සිංහල සේවය ආරම්භ වූයේ වසර 1975 ජනවාරි පළමු දාය. එවක පැවැතියේ කෙටි තරංග විකාශනයක් පමණි. වසර 2010 අප්‍රේල් 23 වනදා එහි FM තරංග විකාශනය ආරම්භ කෙරිණ.

මේ වන විට චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි හා රූපවාහිනී මාධ්‍ය හා පුවත්පත් සමඟ මනා සහයෝගික සම්බන්ධතාවකින් යුක්තව ඉදිරියට ගමන් කරමින් සිටී.

චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවයේ වැඩසටහන් ශ්‍රී ලංකාවේ සමස්ත පවුල් ඒකකය ඉලක්ක කොට විසුරුවා හරිනු ලැබේ. වැඩසටහන් අන්තර්ගතය චීනය සහ ශ්‍රී ලංකාව අතර ඇති සාම්ප්‍රදායික මිත්‍රත්වය සහ රාජ්‍යතාන්ත්‍රික බැඳීම පදනම් කොට සකස් කර තිබේ. සතියේ දින පහ තුළ, ආර්ථිකය, සංස්කෘතිය, ජන ජීවිතය සහ මිත්‍රත්වය, සංචාරය, සූප කලාව, චීනයේ භාෂා අධ්‍යයනය වැනි විෂය ක්ෂේත්‍ර ඔස්සේ වැඩසටහන් විකාශනය කෙරේ. විචිත්‍රාංග සමාජ හා කාලීන තොරතුරු සඳහා ද විශේෂත්වයක් හිමිව තිබේ. චීනයේ ශ්‍රී ලංකාවේ සහ ලෝකයේ නැවුම් තොරතුරු රැගත් ප්‍රවෘත්ති විකාශනයක්ද දිනපතා සිදුකෙරේ.

中 国 国 际 广 播 电 台
CHINA RADIO INTERNATIONAL

**SINHALA SERVICE**
**CHINA RADIO INTERNATIONAL**

No.16A, Shijingshan Road,
Beijing, P.R. China
Post code:100040
Tel: 00 86 10 6889 2374/0439
Fax: 00 86 10 68892361
Email: sinhalacri@gmail.com
Web: http://sinhalese.cri.cn/
Facebook: Cheena Sinhala handa
Twitter: Voice of China-Lanka